# ශ්‍රී ලංකාවේ මූල්‍ය පද්ධතියේ කේන්ද්‍රස්ථානය සමග එක්වීමට ඔබටත් අනගි අවස්ථාවක්



**ශ්‍රී ලංකා මහ බැංකුව**
**இலங்கை மத்திய வங்கி**
**CENTRAL BANK OF SRI LANKA**

ශ්‍රී ලංකාවේ මූල්‍ය පද්ධතියේ කේන්ද්‍රස්ථානය වන ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රධාන පුස්තකාලයාධිපති තනතුරට වසර දෙකක පරිවාස කාලයකට යටත්ව, පුස්තකාල සංවෘත සේවාවේ මාණ්ඩලික පංතියේ දෙවන ශ්‍රේණියට බඳවා ගැනීමට සලකා බැලීම සඳහා පහත දැක්වෙන සුදුසුකම් හා පළපුරුද්දක් සහිත කාර්යශූර ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

## ප්‍රධාන පුස්තකාලයාධිපති තනතුර

**1. කාර්යය :**

ශ්‍රී ලංකා මහ බැංකුවේ තොරතුරු, දැනුම් හා පර්යේෂණ අවශ්‍යතා ඉටු කිරීම සඳහා පුස්තකාල හා තොරතුරු මධ්‍යස්ථානයේ සමස්ත කළමනාකරණය හා සංවර්ධනය සිදු කිරීම. තෝරාගත් අයදුම්කරු ශ්‍රී ලංකා මහ බැංකුවේ සන්නිවේදන දෙපාර්තමේන්තුවට අනුයුක්තව ඇති පුස්තකාල හා තොරතුරු මධ්‍යස්ථානයේ ප්‍රධාන පුස්තකාලයාධිපති ලෙස පත් කරනු ලැබේ.

**2. සුදුසුකම් සහ පළපුරුද්ද :**

විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිසම විසින් පිළිගත් දේශීය හෝ විදේශීය විශ්ව විද්‍යාලයකින් පිරිනමනු ලැබූ පුස්තකාල හා තොරතුරු විද්‍යාව පිළිබඳ පශ්චාත් උපාධියක් සහ පර්යේෂණ ආයතනයකට/වෙනත් පිළිගත් ආයතනයකට අයත් පුස්තකාලයක විධායක මට්ටමේ තනතුරක අවම වශයෙන් වසර හතක (07) පළපුරුද්ද

**අයදුම්කරුවන් තොරතුරු සැකසීම සහ ප්‍රචාරණය සඳහා තොරතුරු තාක්ෂණ කුසලතාවලින් හෙබි විය යුතු අතර ඩිජිටල් පරිසරයක (Digital Environment) කාර්යය ඉටු කිරීමට හැකියාව තිබිය යුතුය.**

**3. වයස :**

**2019 සැප්තැම්බර් 20** වන දිනට වයස **අවුරුදු 45 ට** නොවැඩි විය යුතුය.

අධ්‍යාපනික/වෘත්තීය සුදුසුකම් සහ පළපුරුද්දට අදාළ සහතිකවල ඡායා පිටපත් යොමු කිරීමට අයදුම්කරුවන් වග බලා ගත යුතුය. එම සහතිකවල ඡායා පිටපත් අමුණා නොමැති අයදුම්පත් බඳවා ගැනීමේ ක්‍රියාවලියේ ඕනෑම අවස්ථාවකදී කිසිදු දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**4. වැටුප් හා දීමනා :**

ආකර්ෂණීය වැටුපක්, මාස දෙකක දළ වැටුපට සමාන වාර්ෂික විශේෂ දීමනාවක්, අර්ථසාධක අරමුදල, සේවා නියුක්තයන්ගේ භාර අරමුදල, වෛද්‍ය ප්‍රතිලාභ ක්‍රමය, සේවක ණය පහසුකම්, විශ්‍රාම ප්‍රතිලාභ හා පුහුණුවීම් අවස්ථා

### තෝරා ගැනීමේ පිළිවෙල

මේ සම්බන්ධයෙන් පැවැත්වීමට නියමිත සම්මුඛ පරීක්ෂණයේ දී දක්වන කුසලතාවය මත පදනම්ව අයදුම්කරු තෝරාගනු ලැබේ.

### අයදුම්පත්

නියමිත ආකෘති පත්‍රයට අනුව සකස් කළ අයදුම්පත් **2019 සැප්තැම්බර් 20** වන දිනට හෝ ඊට පෙර අධ්‍යක්ෂ/මානව සම්පත් වෙත ලැබෙන සේ පහත සඳහන් ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. නියමිත ආකෘතියට අනුව සකස් කළ අයදුම්පත් පමණක් ඉදිරිපත් කිරීමට අයදුම්කරුවන් වග බලා ගත යුතුය.

මහ බැංකුවේ වෙබ් අඩවිය වන **http://www.cbsl.gov.lk** මගින් නියමිත අයදුම්පත් ආකෘති පත්‍රය ලබා ගත හැකිය.

අවශ්‍ය සුදුසුකම් සපුරා නොමැති අයදුම්කරුවන්ගේ අයදුම්පත්, නියමිත දිනට පසුව ලැබෙන අයදුම්පත් හෝ නියමිත ආකෘතියෙන් බැහැර වූ අයදුම්පත් කිසිදු දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට අපේක්ෂිත සුදුසුකම් සපුරා නොමැති තැනැත්තන් මෙම තනතුර සඳහා අයදුම් කිරීමට සුදුසුකම් නොලබන අතර අපේක්ෂකයන් සම්මුඛ පරීක්ෂණයේ දී අදාළ සහතිකපත්‍ර වල මුල් පිටපත් ඉදිරිපත් කිරීමට අපොහොසත් වුවහොත් කවර හේතුවක් යටතේ හෝ මෙම තනතුර සඳහා පත් කර ගනු නොලබයි.

තෝරා ගැනීම සඳහා කුමන ආකාරයකින් හෝ බලපෑම් කිරීම හෝ එසේ කිරීමට තැත් කිරීම බඳවා ගැනීම සඳහා නුසුදුසුකමක් වේ.

බඳවා ගැනීමේ ක්‍රියාවලිය කල් දැමීම හෝ අවලංගු කිරීමේ අයිතිය ශ්‍රී ලංකා මහ බැංකුව සතුය.

**අධ්‍යක්ෂ-මානව සම්පත්**
**ශ්‍රී ලංකා මහ බැංකුව, අංක 30, ජනාධිපති මාවත, කොළඹ 01**
**දුරකථන : 0112477330 ෆැක්ස් : 0112477715**

Source: www.cbsl.gov.lk (2019.09.01)